බරීරා තුමිය හා ඇයගේ ස්වාමියා පිළිබඳ කතාව.

ඉබ්නු අබ්බාස් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. බරීරා හා ඔහුගේ ස්වාමියා අතර වූ සිද්ධියක, නබි -සල්ලල්ලාහු අලය්හි
වසල්ලම්- තුමා ඇය අමතා ((ඔබ ඔහු වෙත නැවත යන්නේ නම් මැනව)) යැයි පැවසූහ. අල්ලාහ්ගේ දූතයාණනි, ඔබ මට අණ කරන්නෙහිද? යැයි ඇය විමසා සිටියාය. ((මම මැදිහත්ව කතා කරනවා පමණි)) යැයි එතුමාණෝ පැවසූහ. ඔහු සම්බන්ධයෙන් කිසිදු අවශ්යතාවක් මට නැතැයි ඇය පවසා
සිටියාය.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

බරීරා -රළියල්ලාහු අන්හා- තුමියගේ සැමියා වහලෙකු විය. ඔහු නමින් මුගීස් -රළියල්ලාහු අන්හු- යැයි අමතනු ලැබීය. බරීරා -රළියල්ලාහු අන්හා- තුමියව මිලට ගැනීමට පෙර ඇය ආඉෂා - රළියල්ලාහු අන්හා- තුමියට සේවය කරමින් සිටියාය. ඇයව එතුමිය විසින් නිදහස් කළ කල්හි මුගීස් සමග රැඳී සිටීමට හෝ වෙන්වීමට හෝ නිදහස ඇයට පිරිනමන ලදී. එවිට බරීරා - රළියල්ලාහු අන්හා- තුමිය ඔහුගෙන් වෙන් වූවාය. පවුල් සම්බන්ධතාව බිඳී යාමෙන් පසු මුගීස් මදීනාවෙහි වීදිවලත් මාර්ගවල්වලත් ඇය පසු පසින් කැරකෙමින් අඩමින් සිටියේය. ඔහුගේ කඳුළු යටි රැවුල තුලින් ගලා යන්නට විය. එය බරීරා -රළියල්ලාහු අන්හා- තුමිය සම්බන්ධයෙන් වූ දැඩි ආදරය නිසාවෙනි. ඔවුන් දෙදෙනා නැවත එකතු වීම ගැනත් ඇය ඔහු වෙත නැවත පැමිණීම ගැනත් ඔහු ඇයට පැහැදිළි කළේය. එවිට නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා බරීරා -රළියල්ලාහු අන්හා- දෙස බලා ඔබ ඔහු වෙත නැවත යන්නේ නම් ඔබට කුසල් හිමිවනු ඇතැයි පැවසූහ. එවිට බරීරා - රළියල්ලාහු අන්හා- තුමිය අල්ලාහ්ගේ දූතයාණනි, ඔහු වෙත නැවත යෑම ගැන අනිවාර්යයෙන්ම ඔබ මට අණ කරන්නෙහිදැ?යි විමසා සිටියාය. එවිට -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා මම ඔහු වෙනුවෙන් මැදිහත්වී කටයුතු කරනවා පමණි යැයි පැවසූහ. එවිට ඇය: ඔහු වෙත නැවත යාමට කිසිදු හේතුවක් හෝ ආශාවක් හෝ මට නැතැයි පවසා සිටියාය.

https://sunnah.global/hadeeth/si/show/3741